# නූතන පවුල් ගැටලු නිරාකරණයෙහිලා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව

එන්. ඒ. කේ. හර්ෂණී - බෞද්ධ අධ්‍යයනාංශය

නූතන පවුල් ජීවිතයේ උද්ගත වී ඇති ගැටලු පුළුල් සන්දර්භයකින් යුතුව සමාජයේ සාකච්ඡාවට ලක්වී ඇති මාතෘකාවකි. පවුල පිළිබඳ සංකල්පය එදා සමාජයේ සහ අද සමාජයේ විචලනය වී නැති නමුත් එහි උද්ගතවන ගැටලුවල වර්ධනයක් විද්‍යමාන වේ. එවැනි පසුබිමක පවුල් ගැටලු නිරාකරණය පිණිස නූතන බටහිර උපදේශනය සහ මනෝ චිකිත්සාව පදනම් කරගත් විවිධ ප්‍රවේශ ක්‍රියාත්මක වුවද එම ගැටලුවල ඌණතාවක් සිදුවනවා වෙනුවට වර්ධනයක් විද්‍යමාන වේ. එබැවින් එයට බලපාන හේතු සාධක අධ්‍යයනය කර ඒ සඳහා සාර්ථක පිළියම් ඉදිරිපත් කිරීම කාලීන සමාජ අවශ්‍යතාවකි. සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ක්‍රි. පූ. 06වන සියවසේ විසූ බුදුන්වහන්සේ ද ඉදිරිපත් කර තිබේ. එහෙයින් නූතන පවුල් ගැටලු නිරාකරණයට බුදුදහමේ ඉගැන්වීම් අදාළ කරගත හැකිද යන්න ගැටලුව ලෙස ගෙන, නූතන පවුල් ගැටලු නිරාකරණයට බුදුදහමින් මඟපෙන්වීම මෙහි අරමුණයි. නූතන ලෝකයේ පවතින විවිධ දර්ශන උක්ත සංකල්පය පිළිබඳ ඉදිරිපත් වී ඇති විසඳුම් අබිබවා බුදුදහමේ ඒ සඳහා අදාළ කරගත හැකි වඩාත් ප්‍රායෝගික විසඳුම් සාකච්ඡාවට ලක් වී ඇත. ගුණාත්මක දත්ත පදනම් කරගත් මෙම පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ත්‍රිපිටකය භාවිත කළ අතර ද්විතීයික මූලාශ්‍රය ලෙස ඉංග්‍රීසි සහ සිංහල ශාස්ත්‍රීය ග්‍රන්ථ, සඟරා සහ පුවත්පත්පත් වාර්තා පරිශීලනය කෙරිණි. ස්වාමි-භාර්යා, දෙමාපිය-දූ දරු යුතුකම් හා වගකීම් වෙන් වෙන් ව විග්‍රහ කරමින්, සිය පවුල වෙනුවෙන් තම දායකත්වය කායික, මානසික හා වාචසික වශයෙන් කෙසේ දැක්විය යුතු ද’යි බුදුසමයෙහි මනාව විග්‍රහ කර ඇත. එහෙයින් කාලභේදයකින් තොර ව පවුල් ගැටලු නිරාකරණයට අදාළ වඩාත් ප්‍රායෝගික ඉගැන්වීම් බුදුදහමේ අන්තර්ගත වන බවත් ඒවා නූතන සමාජ, ආර්ථික පසුබිමක් සහිත පවුල් ජීවිතවල ගැටලු නිරාකරණයට උපයුක්ත කර ගත හැකි බවත් මෙම ශාස්ත්‍රීය පර්යේෂණයෙන් අනාවරණය විය.

***ප්‍රමුඛ පද:*** *පවුල් ගැටලු, උපදේශනය, මනෝ චිකිත්සාව*